## ගුණාත්මය වැඩි දියුණු කිරීම

- කොම්පෝස්ට් දියරය ඉසීමට දින දෙකකට පෙර ග්ලිරිසීඩියා, වල් සූරියකාන්ත, මකුණ, කැප්පෙටියා වැනි ශාකවල කොළ කි.ග්‍රෑ. 3 - 5 ක් පමණ තලා පෙඟෙන්නට දමන්න.

- එම පෙරා ගත් දියරය ද කොම්පෝස්ට් දියරය සමඟ මිශ්‍ර කර ඉසීම කළ යුතුයි.

*මිශ්‍ර කරන අනුපාතය*

*කොම්පෝස්ට් දියර : කොළ නිස්සාරකය : ජලය*

2 : 1 : 5



මකුණ



ග්ලිරිසීඩියා



වල් සූරියකාන්ත



පාවට්ටා

වී වගාවේ පඳුරු දමන හා පීදෙන අවස්ථාවලදීත්, එළවළු වගාවේ පඳුරු දමන හා මල් පිපෙන අවස්ථාවලදීත් කොම්පෝස්ට් දියරය යෙදීමේ දී මෙසේ පෝෂණ ගුණාත්මය වැඩි දියුණු කිරීම වැදගත් වේ.

තද හිරු රශ්මියට කොම්පෝස්ට් දියරයෙහි ගුණාත්මය විනාශ වීම අවම කිරීම සඳහා සවස් වරුවෙහි දී ක්ෂේත්‍රයට ඉසීම සිදු කළ යුතුය.

## පළිබෝධ හානි වලක්වා ගැනීම සඳහා

පළිබෝධ හානි දක්නට ලැබෙන මුල් අවස්ථාවේදීම කොහොඹ නිස්සාරකය කොම්පෝස්ට් දියරය සමඟ මිශ්‍ර කර දින දෙකකට වරක් ඉසීම කළ යුතුය.

මෙහි දී සැර ඉතා අඩු සබන් කුඩු ග්‍රෑම් 10ක් පමණ දිය කර මිශ්‍ර කිරීමෙන් වඩා හොඳ ප්‍රතිඵල ලබා ගත හැක.

ගොයම් මැසි උවදුරේ ආරම්භක අවස්ථාවේදීම කොම්පෝස්ට් දියර මිශ්‍රණයට ගොයම් මැස්සන් කිහිප දෙනෙකු පොඩිකර දමා ඉසීමෙන් ගොයම් මැස්සන් පලවා හැරිය හැකිවේ.

## කොම්පෝස්ට් දියරයෙහි පෝෂණ අගය

| පෝෂණ ගුණාත්මය | සාමාන්‍ය කොම්පෝස්ට් | කොම්පෝස්ට් දියරය |
|---|---|---|
| පී.එච්.අගය | 8.2 | 7.34 |
| ලවණතාව (ds/m) (1:5) | 2.6 | 2.20 |
| නයිට්‍රේට් (%) | 1.8 | 2.05 |
| ලබා ගත හැකි පොස්පරස් (%) | 1.38 | 0.65 |
| පොටෑසියම් (%) | 0.64 | 2.63 |
| කැල්සියම් (%) | | 1.84 |
| මැග්නීසියම් (%) | | 0.24 |
| සින්ක් (%) | | 0.03 |

*වැදගත්*

*ස්වභාවික දියර පොහොරක් වුවද බෝග වගා වලට යෙදීමේ දී පසු අස්වනු කාලය දින 5 ක් වත් පවත්වා ගන්න.*

**වැඩි විස්තර**
ප්‍රියංගා එස්. දිසානායක
සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (පර්යේෂණ),
ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය
මාකඳුර, ගෝනවිල (වයඹ)
දුරකථන : 031-2299625

**සැකසුම**
ශ්‍රව්‍ය දෘෂ්‍ය මධ්‍යස්ථානය, ගන්නොරුව

**මුද්‍රණය**
කෘෂිකර්ම ප්‍රකාශන ඒකකය, ගන්නොරුව

**අනුග්‍රහය**
ANSOFT ව්‍යාපෘතිය

# කොම්පෝස්ට් දියරය
# (කොම්පෝස්ට් තේ)









කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයකි - 2015

කාබනික වගාවේ දී කාබනික පොහොර (ගොම, කුකුල් පොහොර හෝ කොම්පෝස්ට්) අක්කරයකට ටොන් 20 ක් පමණ යෙදීමට අවශ්‍ය වේ. ප්‍රායෝගිකව මෙය තරමක් අපහසු ක්‍රියාවක් වන අතර අධික ශ්‍රමයක් ද වැය වේ. නමුත් එම ප්‍රමාණයෙන් අඩක් මූලික පොහොර ලෙස පසට යොදා අමතර ව කොම්පෝස්ට් දියරය ඉසීම මඟින් සාර්ථක අස්වැන්නක් ලබා ගත හැකි බව පර්යේෂණ මඟින් සොයාගෙන ඇත.

අක්කරයක් සඳහා කොම්පෝස්ට් දියරය සකස් කර ගැනීමට අවශ්‍ය වන්නේ කොම්පෝස්ට් කි.ග්‍රෑම් 50ක ප්‍රමාණයකි.

- කොම්පෝස්ට් දියරය ඉසීම මඟින් ශාක පෝෂක රැසක් සුළු ප්‍රමාණ වලින් හෝ ශාකවලට හා පසට ලැබෙන අතර මේවා පහසුවෙන් ශාකවලට උරා ගත හැකි ආකාරයෙන් පවතී.

- ශාක පෝෂක ලබා දීමට අමතරව ක්ෂුද්‍ර ජීවීන් රාශියක් ජීවත් වන බැවින් ඔවුන්ගෙන් ශාක වල වර්ධනයට, රෝග පාලනයට හා පරිසර තත්ත්වයනට ඔරොත්තු දීමට හැකියාවක් ද ලැබේ.

- වෙසෙසින්ම මෙම ද්‍රාවණයේ ජීවත් වන හිතකර ක්ෂුද්‍ර ජීවීන් මඟින් ශාකයේ හා පසෙහි ජීවත් වන රෝගකාරක ක්ෂුද්‍ර ජීවීන්ව මර්දනය කරමින් ප්‍රතිජීවකයක් ලෙස ක්‍රියා කරයි.

- තවාන් පාලනයේ දී කොම්පෝස්ට් දියරය ඉතා සාර්ථක වගා උත්තේජකයක් ලෙස යොදා ගත හැකිය.



## අක්කරයකට කොම්පෝස්ට් දියරය සැකසීම සඳහා

- ප්ලාස්ටික් බඳුනක් හෝ බැරලයක් (ලීටර් 100).
- ගුණාත්මයෙන් ඉහළ කොම්පෝස්ට් කි.ග්‍රෑ. 12 - 15 ක්.
- සක්කර හකුරු/උක් හකුරු දියර (මොලැසස්) හෝ ඉවතලන පලතුරු කි.ග්‍රෑ. 1 ක් පමණ (අන්නාසි, කෙසෙල් ආදී).
- පිරිසිදු ජලය (ක්ලෝරීන් මිශ්‍ර නොවූ).
- කොම්පෝස්ට් බහාලීමට රෙදි කවරයක්/ පැරණි කොට්ට උරයක් හෝ හන ගෝනියක්.
- ලණු කැබැල්ලක් (මී. 1ක් පමණ දිග) හා ලී දණ්ඩක්.
- ආවරණය කිරීමට දැලක්/රෙදි කැබැල්ලක් හෝ ගෝනියක්.

## පිළියෙල කරන ආකාරය

- කොම්පෝස්ට් හා ජලය ගත යුතු අනුපාතය
  පරිමාව අනුව කොම්පෝස්ට් 1 : ජලය 5
- කොම්පෝස්ට් මල්ල බැරලය තුළ ජලයේ ගිල්වා ගැට ගැසූ කෙළවර දණ්ඩේ මැදින් එල්ලා තබන්න.
- මෙම ඇටවුම සිසිල් සෙවන ස්ථානයක තබන්න.
- මදුරුවන් බෝවීම හා සතුන් වැටීම වැළැක්වීමට පැරණි දැල්/රෙදි කැබැල්ලකින් වසා තබන්න.
- දින 5-7 කට පසු භාජනයේ ඇති කොම්පෝස්ට් දියරය භාවිතය සඳහා සුදුසු වේ.

*ඉහළ ගුණාත්මයෙන් යුතු කොම්පෝස්ට් දියරය සෑදීමේදී විශේෂ අවශ්‍යතාව වන්නේ ස්වායු තත්ත්වයක් පවත්වා ගැනීමයි.*

## අතින් කලවම් කිරීම මඟින් කොම්පෝස්ට් දියරය සැකසීම



වාතනය කිරීම සඳහා ඔක්සිජන් සැපයුමක් භාවිතා කිරීම, කුඩා බඳුනක් යොදාගෙන පෙණ නගින සේ මිශ්‍ර කිරීම හෝ ලී දණ්ඩක ගැට ගසා උස් පහත් කිරීම මඟින් වාතය හා හොඳින් කළවම් කිරීම කළ යුතුය.

## ඔක්සිජන් සැපයුමක් භාවිතයෙන් කොම්පෝස්ට් දියරය සැකසීම




## කොම්පෝස්ට් දියරය භාවිතා කරන ආකාරය

කොම්පෝස්ට් දියරය ජලය සමඟ 1 : 3 අනුපාතයට මිශ්‍ර කර සවස් වරුවේ ඉසීම කළ යුතුය.

- තවාන් සඳහා - දින 7-10 වයස දී.
- වපුරා/ පැළ සිටුවා සති 2, 4 හා 6 යන කාල වල දී.



ප්‍රතිකාර කරන ලද මුං බීජ පැළ

වී වගාවේ දී සහ එළවළු තවාන් වලදී දිලීර නාශක වෙනුවට බීජ ප්‍රතිකාරකයක් ලෙස භාවිතා කළ හැකිය.

මෙහි ඇති පෝෂක නිසා මුල් ඇදීම හා වර්ධනය ඉක්මන් වේ.

